[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම

මාතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය	විෂයය - භූගෝල විද්‍යාව	පත්‍රය I	පැය - 01 යි.

නම .....

I කොටස

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුර තිත් ඉරි මත ලියන්න.

1).අභ්‍යවකාශයේ සිට පෘථිවිය දෙසට ඇදී එන උල්කාෂ්ම බොහෝමයක් දැවී විනාශ වන්නේ ..... ගෝලයේ දී ය .
(පරිවර්තී / අපවර්තී / මෙසෝ)

2). පෘථිවි කබොල ,ප්‍රචාරණයෙන් වෙන්වන සීමා ..... නමින් හැඳින්වේ.
(ගුටෙන්බර්ග් අසන්තතිය / පහළ ආවරණය / මොහොරෝවිසිත් ආසන්නතිය)

3). ලෝකයේ පිහිටා ඇති .....ආගාධය ගැඹුරුම අගාධය ලෙස හැඳින් වේ.
(මරියානා / මින්ඩනාඕ)

4). නිවර්තන කලාපය සමකයත් ..... අතර පිහිටා ඇත.
(මකර නිවර්තනය / කර්කටක නිවර්තනය / ආක්ටික් වෘත්තය)

5). ලෝකයේ ගංහා ඇළ දොළ හිම ප්‍රදේශවල ඇති ජලය .....ජලය ලෙස හැඳින්වේ.
(සාගර ජලය / භූගත ජලය / භූතල ජලය)

අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් (නි) අකුර වටා ද වැරදි නම් (වැ) අකුර වටා ද රවුම් කරන්න.

6). පැපුවා, නිව්ගිනියා, තස්මේනියා දුපත් අප්‍රිකා මහද්වීප තටකය තුළ පිහිටා ඇත. (නි / වැ)

7). ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගාවට යොදා ගනු ලබන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයයි. (නි / වැ)

8). ඔඩ්ඩිසුඩාන්, අම්පාර, කොච්චිකඩේ හා මීගමුව යන ප්‍රදේශවල පිහන් තැනීම සඳහා අවශ්‍ය බෝල මැටි ව්‍යාප්ත වී ඇත. (නි / වැ)

09). කඳු වැටි නිම්න නෙරු හා සානු වැනි භූ ලක්ෂණ පෙන්නුම් කිරීමට සමෝච්ච රේඛා භාවිතා කරයි. (නි / වැ)

10). ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි හා මහාමාර්ග ඉදිකිරීම් කටයුතුවලදී අවසාදිත පාෂාණ බහුලව භාවිතා කෙරේ. (නි / වැ)

අංක 11 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

11). පෘථිවි ශිලාගෝලය, එකිනෙකට සාපේක්ෂව ඉතා සෙමින් චලනය වෙමින් පවතින ……..……..…….. වලින් නිර්මාණය වී ඇත .

12). ලෝකයේ උසින්ම පිහිටා ඇති විලක් ලෙස …….. විල ප්‍රධාන තැනක් උසුලයි.

13). මහ ඉලුප්පල්ලම වී පර්යේෂණායතනය පිහිටා ඇත්තේ ……..…… දිස්ත්‍රික්කයේ ය.

14). බීරලු සහ කැටයම් කැපීම, පැදුරු, පෙට්ටි සහ මලු නිෂ්පාදන ආදිය ……..……. කර්මාන්ත ලෙස හඳුන්වයි .

15). ශ්‍රී ලංකාවේ මුළු ජන සංඛ්‍යාවෙන් 5.2% ක් තරම් වූ අඩුම ජන සංඛ්‍යාවක් ව්‍යාප්තව ඇත්තේ …… පළාත තුළය.

16). ලුණු මිශ්‍ර වැලි පස හා වැලි බිම් වඩාත් යෝග්‍ය වන්නේ …… වගාවට ය.


17). ශාක පත්‍රවල ඇති ජලය …… වීමෙන් ඒවා වායුගෝලයට එක් වේ.

18). උතුරු ඇමරිකාවේ පිහිටා ඇති ප්‍රධාන කඳු පන්තිය……..... නමින් හැඳින්වේ.

19). ඔසාකා කෝබේ, කියෝතෝ වැනි යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන ස්ථාන ගත වී ඇත්තේ ……..... රටේ ය.

20). තීන්ත වර්ග, පැන්සල් කුරු, වාත්තු අච්චු නිපදවීම වැනි දේශීය කර්මාන්ත සඳහා යොදා ගන්නේ ……..... ය.

අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සටහන උපයෝගී කර ගනන්න.



21). ඉහත ප්‍රස්ථාරයට අනුව වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන්නේ …….... මහද්වීපයේ ය.

22). අඩුම ජන සංඛ්‍යාවක් වාසය කරන්නේ …….... මහද්වීපයේ ය.

23). ආසියා සහ අප්‍රිකා යන මහද්වීප දෙකෙහි ම වාසය කරන ජන සංඛ්‍යාව …….. කි.

24). උතුරු හා දකුණු ඇමරිකා මහද්වීප දෙකෙහි ම වාසය කරන ජන ප්‍රතිශතය……කි.

25). ආසියා මහද්වීපයේ රටවල් අතරින් වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන්නේ ……..... ය.

අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවල "අ" තීරුවේ දක්වා ඇති කොරතුරු අනුපිළිවෙලට "ආ" තීරුවේ ඇති කොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියා දක්වන්න.

26). "අ" තීරුවේ ඇති භෞතික ලක්ෂණ හා "ආ" තීරුවේ ඇති ස්වභාවයන් නිවැරදිව ගැළපූ විට පිළිතුර වන්නේ ,

අ	ආ
• අන්දීස්	A. විල
• මැඩගස්කර්	B. සානුව
• බයිකල්	C. කඳුවැටිය
• කොස්ලන්ද	D. දූපත

1).ABCD 2). BCDA 3). CDAB 4). DCAB (…...)

27). ශ්‍රී ලංකාවේ අපනයන ගම්මාන පිහිටි ස්ථාන කිහිපයක් ‘‘අ’’ තීරුවේ ද ඒවා හා සම්බන්ධ අපනයන බෝග කිහිපයක් ‘‘ආ’’ තීරුවේ ද දැක්වේ.

අ	ආ
• බණ්ඩාරවෙල	A. කරදමුංගු
• කෑගල්ල	B. මල්
• රාජාංගනය	C. පැහිරි
• මාතර	D. මිරිස්

28). පහත "අ" තීරුවේ ඇති රටවල්වලට අදාළ නගර "ආ" තීරුවෙන් ගැලපූවිට අදාළ පිළිතුර වන්නේ,

අ	ආ
• ඇමරිකා එක්සත් ජනපදය	A. පිලඩෙල්පියා
• බ්‍රසීලය	B. සෝල් අගනුවර
• දකුණු ඇමරිකාව	C. ෂැංහයි
	D. රියෝ ද ජැනෙයිරෝ

1).ADB 2). ADC 3). BCD 4). DAB (…...)

29). පහත "අ" තීරුවේ දැක්වෙන රක්ෂිත හා ඒවා පිහිටි ප්‍රදේශ "ආ" තීරුවෙන් ගැලපූවිට අදාළ පිළිතුර වන්නේ,

අ	ආ
• අභය භූමි	A. උඩවලව
• ජාතික උද්‍යාන	B. වැඩිහිටි කන්ද
• දැඩි ස්වභාවික රක්ෂිත	C. රිටිගල
	D. මින්නේරිය

1).ACB 2). BDC 3). CBA 4). DAC (…...)

30). පහත සඳහන් "අ" හි ඇති ජලවිදුලි බලාගාර හා "ආ" හි සම්බන්ධ ගංගාව නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

අ	ආ
• රන්ටැඹේ	A. වලවේ
• ලක්ෂපාන	B. මහවැලි
• සමනළ වැව	C. කැළණි
	D. කළු

1).ABC 2). BDC 3). BCA 4). DC A (…...)

ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.

31). ජෛව ගෝලයේ පැවැත්මට හා ක්‍රියාකාරීත්වයට බලපාන අජෛව සාධකයක් නම්,
1). ශාක 2).සතුන් 3). දේශගුණය 4). වියෝජකයින් (.....)

32). ලෝකයේ වැඩිම තිරිඟු නිෂ්පාදනයක් සිදු කරන රටවල් අනුපිළිවෙල අනුව නිවැරදි පිළිතුර වන්නේ,
1). චීනය, ඉන්දියාව, රුසියාව හා ඇමරිකා එක්සත් ජනපදයයි.
2). ඉන්දියාව, කැනඩාව, යුක්‍රේනය හා පාකිස්ථානයයි
3). රුසියාව, ඉන්දියාව, චීනය හා කසකස්ථාන යයි
4). ආර්ජන්ටිනාව, කැනඩාව, චීනය හා රුසියාව යි (.....)

33). ශ්‍රී ලංකාවේ කිවුල්දිය ධීවර කර්මාන්තය සිදු කෙරෙන ප්‍රධාන ස්ථාන ඇතුළත් පිළිතුර තෝරන්න.
1). බේරුවල, මීරිස්ස, දෙවුන්දර
2). පදවිය, නුවරඑළිය, උඩවළවේ
3). කෝකිලායි, කල්කුඩා, පදවිය
4). මුන්දලම, හලාවත, ආරුගම් බොක්ක (.....)


34). ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශයට අයත් සංචාරක ප්‍රදේශයක් ලෙස සැලකෙන නගරයක් නම්,
1). මඩකලපුව 2). මාරවිල 3). බෙන්තොට 4). නුවරඑළිය (.....)

35). A. 27 °C ආසන්න ඒකාකාරී මධ්‍ය උෂ්ණත්වයයි. B. 200 mm ට වැඩි වාර්ෂික වර්ෂාපතනය
C. 30m - 300m අතර උස්බිම් (මද බෑවුම් සහිත) D. කබොක් පස
ඉහත භෞතික සාධක වඩාත් උචිත වන ව්‍යාපාරික බෝග කුමක්ද?
1). තේ 2).රබර් 3). පොල් 4). කුරුඳු (.....)

36). වියලි කලාපයට සීමා වූ මෙම පස වියළි බෝග වගාවට සහ හේන් වගාවට සුදුසුය.
1). දියලු පස 2). රතු දුඹුරු ලැටසෝල් පස
3). රතු දුඹුරු පස 4). චූර්ණමය නොවූ දුඹුරු පස (.....)

37). ජන සංඛ්‍යා ව්‍යාප්තිය කෙරෙහි බලපාන මානුෂ සාධකයක් වන්නේ,
1). යටිතල පහසුකම් වර්ධනය 2). ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය
3). ස්වාභාවික වෘක්ෂලතා ව්‍යාප්තිය 4). සුදුසු උෂ්ණත්ව ව්‍යාප්තිය (.....)

පහත රූප සටහනෙහි A,B,C සහ D වලින් දක්නට ඇත්තේ 1:50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන බෑවුම් වර්ග කිහිපයක් නිරූපිත සමෝච්ඡ රේඛා රටා හතරකි. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



38). ඉහත රූප සටහනෙහි අවතල බෑවුමක් දැක්වෙන රටාව වන්නේ,
1). A 2). B 3). C 4). D

39). උත්තල බෑවුමක් දැක්වෙන රූප සටහන වන්නේ,
1). A 2). B 3). C 4). D

40). දිය ඇල්ලක් නිර්මාණය විය හැකි භූ ලක්ෂණයක් දැකිය හැකි රේඛා රටාව වන්නේ,
1). A 2). B 3). C 4). D

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම කල්විත් වලයම් මාතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මාතුගම

මාතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය	විෂයය - භූගෝල විද්‍යාව	පත්‍රය II	පැය - 02 යි.

නම .....

II කොටස

- **පළමු කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **II කොටසින් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

I කොටස

01). (අ) **ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා වේ 1: 50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

I). A අක්ෂරයෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක්ද ? (ගංභාවකි, වැවකි, වගුරුබිමකි) (ලකුණු 01)

II). B අක්ෂරයෙන් දැක්වෙන වගාව කුමක්ද ? (තේ, වී, රබර්) (ලකුණු 01)

III). C අක්ෂරයෙන් දැක්වෙන භූ ලක්ෂණය නම් කරන්න ? (පාලම, වැව් බැම්ම, අඩිපාර) (ලකුණු 01)

IV). D අක්ෂරයෙන් දක්වා ඇති කන්දෙහි ස්ථානීය උස සඳහන් කරන්න. (ලකුණු 01)


V). මෙම සිතියමේ කොටුකර ඇති ප්‍රදේශයේ දක්නට ලැබෙන සංස්කෘතික ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 01)

VI). මෙම සිතියම් ප්‍රදේශයේ බහුලවම වගා කෙරෙන ප්‍රධාන භෝගය කුමක්ද ? (ලකුණු 01)

VII). මෙම සිතියමෙහි සඳහන් ප්‍රදේශයේ ඇති භෞතික ලක්ෂණ පිළිබඳ වැකි දෙකක් ලියන්න. (ලකුණු 02)


VIII). සිතියමෙහි උතුරේ සිට දකුණ දක්වා දිවෙන A9 මාර්ගයේ දිග km වලින් දක්වන්න. (ලකුණු 02)

(ආ). ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම භොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක I සිට V තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දැක්වෙන්න අක්ෂරය සිතියමෙන් තෝරා අදාළ හිස්තැන්හි පිළිතුර ලියා දක්වන්න .



I). අමූර් ගඟ A, B, C (.....)
II). ඇපලේචියන් කඳු D, E, F (.....)
III). ඉරානය G, H, I (.....)
IV). මිචිගන් විල්බඩ ප්‍රදේශය J, K, L (.....)
V). ලොස් ඇන්ජලීස් M, N, O (.....)


(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න . අංක I සිට Vතෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් ලියන්න.



I). මුලතිව් දිස්ත්‍රික්කය A, B, C (.....)
II). මාරවිල D, E, F (.....)
III). විල්පත්තු G, H, I (.....)
IV). නොරොච්චෝලය J, K, L (.....)
V). හම්බන්තොට M, N, O (.....)

II කොටස

02). පෘථිවි ව්‍යුහයේ හරස්කඩක් යාබද රූපයේ දක්වා ඇත.



I). රූප සටහනට අනුව 1 හා 2 අංක වලින් දක්වා ඇති ස්ථර දෙක මොනවා දැයි පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)
II). අංක 2 දරණ ස්ථරයෙහි කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
III). ජල දූෂණයට ඉවහල්වන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් දක්වා ඒවා වළක්වා ගැනීමට ගත හැකි පියවර පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

03).
I). පහත A හා B ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
A සම්පූර්ණයෙන්ම ගොඩබිම්වලින් වට වූ මුහුදක්
B සාගරය හා සම්බන්ධව සාගරයේම පිහිටි මුහුදක් නම් කරන්න. (ලකුණු 02)
II). දේශගුණ වර්ගයක් තීරණය වීම කෙරෙහි බලපාන සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
III). සෞම්‍ය දේශගුණ කලාපයේ දක්නට ලැබෙන ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

04).

I). ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදනය කරනු ලබන

A යුරෝපා රටක් හා


B ආසියාතික රටක් නම් කරන්න. (ලකුණු 02)

II). මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තය එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වී ඇති ප්‍රධාන රටවල් තුනක් දක්වන්න. (ලකුණු 03)

III). වර්තමානයේ දී මෝටර් රථ කර්මාන්තයේ දක්නට ලැබෙන නව ප්‍රවණතා කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

05).

I). පහතින් දැක්වෙන සිතියම අධ්‍යයනය කොට පිළිතුරු සපයන්න.



A. තාප විදුලි බලාගාරයක් වන කෙරවලපිටිය දැක්වෙන අක්ෂරය,

B. Dඅක්ෂරයෙන් දැක්වෙන සූර්යශක්ති බලාගාරය නම් කරන්න. (ලකුණු 02)

II). ජලය පරිහරණයේ දී මතුවන ගැටලු තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

III). පහත සඳහන් වනාන්තර උප පද්ධති (ශ්‍රී ලංකාවේ) ගැන කෙටි විස්තරයක් කරන්න.

A නිවර්තන තෙත් වනාන්තර

B කඩොලාන ශාක පද්ධති ය (ලකුණු 05)

06).

I). ජන ඝනත්වය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ? (ලකුණු 02)

II).ලෝකයේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය අධික ජන සංකේන්ද්‍ර කලාප දෙකක් ලියන්න. (ලකුණු 03)

III). ලෝකයේ ජන සංක්‍රේන්ද්‍රණයේ අසම ව්‍යාප්තිය කෙරෙහි හේතුවන සාධක දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07).

I). සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන නූතන මිනුම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). රටක සංවර්ධන ක්‍රියාවලියේ දී තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III). පසුගිය දස වසරක කාලය තුළ ශ්‍රී ලංකාවේ සිදුකළ සංවර්ධන ව්‍යාපෘති දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

භූගෝල විද්‍යාව 11 ශ්‍රේණිය
පිලිතුරු පත්‍රය
I පත්‍රය

1).අපරවර්ති
2). මොහොරෝ
3).මරියානා
4).මකර නිවර්තනය
5). භූතල ජලය
6). වැ
7).නි
8).නි
9). නි
10). වැ
11). භූ තැටි
12). ටිටිකාකා
13). අනුරාධපුර
14).ගෘහ
15). ගෘහ
16). උතුරු
17).
18). රොකී
19). ජපන්
20). මිනිරන්
21). ආසියා
22).ඕස්ට්‍රේලියා
23). 76%
24). 13%
25). චීනයේ
26). 3
27). 2
28). 1
29). 4
30). 3
31). 3
32). 1
33). 4
34). 1
35). 2
36). 3
37). 1
38). 1
39). 2
40). 4

II පත්‍රය I කොටස

01).
අ).
I කපොල්ල
II ලඳු කැලෑ
III පලාත් මායිම්
IV වෙනත් වැවිලි
V වැව
VI
VII පොල් ,වී
VIII පාසල, තැපැල් කාර්යාලය ,රෝහල

ආ).
I A
II E
III H
IV J
V N

ඉ).
I B
II D
III G
IV J
V N

02).
I කබොල
ප්‍රාවරණ ය
II පෘථිවිය මතුපිට සිට 2900km සමග ගැඹුරට විහිදේ .
ප්‍රාවරණය සහ හරය වෙන්කරන ස කරන සීමාව ගුවෙන් වර්ක් අභ්‍යන්තය නමින් හැඳින්වේ .
මෙම කොටසට පෘථිවිය ට පෘථුවියේ ස්කන්ධයෙන් 2/3 ක් පමණ අයත් වෙයි .
III රසායන ද්‍රව්‍ය ජලයට එක් කිරීම
කර්මාන්ත ශාලාවලින් පිට කරන අපද්‍රව්‍ය ජලයට එක්වීම
මළ අපවහන ය වලක්වා ගැනීම දැනුවත් කිරීම නීති පැනවීම විස්තර කිරීම අවශ්‍ය වේ.

03). I A කළු මුහුදු කැස්පියන් මුහුදු
B අරාබි චීන
II උෂ්ණත්වය
වර්ෂා පතනය
වර්ෂාපතනය ලැබෙන ක්‍රම
වර්ෂාපතනය ලැබෙන කාල සීමාව
III නිවර්තන කලාපයට වඩා උෂ්ණත්වය අඩු ය.
ඍතුභේදය ඇති වේ.
පැහැදිලි වර්ෂාපතනයක් හා සීත ඍතුවක් දක්නට ලැබේ.

මධ්‍යධරණී දේශගුණය ඇති වේ .
ඒ හා සම්බන්ධ කෙටි විස්තරයක්

04).
I A මහා බ්‍රිතාන්‍යය, බ්‍රසීලය ,ඇමරිකා එක්සත් ජනපදය
B රුසියාව,ජපානය ,චීනය,ඉන්දියාව
II ජපානය ,චීනය,දකුණු කොරියාව,සිංගප්පූරුව
III රොබෝ තාක්ෂණය යොදා ගැනීම.
එකලස් කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීම.
නිෂ්පාදන අයිතිය බහු ජාතික සමාගම් සතු වීම.
අධි සුපෝගබෝගී වාහන නිෂ්පාදනය.
පරිසර හිතකාමී වීම ආදි ය.

05).
I A
B බරුණකන්ද
II අපද්‍රව්‍ය එක් වීම
බීමට සුදුසු ජලය නොමැති වීම
ගුණාත්මක භාවය අඩු වීම
ජල උල්පත් සිඳීයාම
ජල දූෂණය ආදිය
III නිවර්තන තෙත් වනාන්තර
අවුරුද්ද මුළුල්ලේ වර්ෂාපතනය හා උෂ්ණත්වය පැවතීම
වනාන්තර තද කොළ පැහැති වීම
කඳුකර ප්‍රදේශවල ව්‍යාප්ත වීම.

06).
I කිසියම් බිම් ඒකකයක් තුළ ජීවත් වවන සංඛ්‍යාවයි.
II නැගෙනහිර ආසියාව
දකුණු හා අග්නිදිග ආසියාව
වයඹ දිග යුරෝපය
ඇමරිකා එක්සත් ජනපද වෙරළබඩ කලාපය
III භෞතික - භූ විෂමතාව, ජල වහනය,උෂ්ණත්වය,වර්ෂාපතනය
සංස්කෘතික - කර්මාන්ත ස්ථානගත වීම , නාගරීකරණය, වෙළෙඳ මධ්‍යස්ථාන , යටිතල පහසුකම්

07).
I භෞතික ජීවන තත්ව දර්ශකය
මානුෂ සංවර්ධන දර්ශකය
මානුෂ දරිද්‍රතා දර්ශකය
මානුෂ පීඩන දර්ශකය
II ජන සංඛ්‍යාව වැඩිවීම
නව නිෂ්පාදන පුළුල් වීම
කාර්මීකරණය පිළිබඳ විධිමත් පාලනයක් නොමැති වීම
III ජන සවිය , සමුර්දි , දිවි නැගුම
මහාමාර්ග සංවර්ධනය ,නාගරික සංවර්ධනය

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න